# පරිසරය රැක ගනිමු

ලොවේ හැම සත දිවි සුරකිනා අම්ලකර වායුව සදන් නේ
සියළු සත හට අහර ලෙස තම සිරුරු කොටසුත් ලබා දෙන් නේ
පොළොවෙ සරුබව සදා සෝදා පාළු හරහට වැට බදින් නේ
ජලය රැක රුක් ලෝ සතුන් හට මහා සේවාවක් කරන් නේ

සියළු සත ගහ කොළ නිපදවන අම්ලකර වායුව උරන් නේ
ගසින් ලැබෙනා අහර ගෙන නිති කාරි කෙරුමට බල ලබන් නේ
සිරුර තුළ දැවෙනා ක්‍රියාවෙන් හිරුගෙ ශක්තිය ලබාගන් නේ
එසේ එලයක් ලෙසින් අංගරකම්ල ($CO_2$) වායුව පිටකරන් නේ

අඟුරු වායුව ($CO_2$) උරා දිය හා මුසුකරයි හිරුගේ බලෙ න්
අහර අම්මලකාර ($O_2$) වායුව ලැබෙයි එහි එලයක් ලෙසි න්
ජිව ශක්තිය සියළු සතහට ලැබේ නිරතුරු මේ දෙකෙ න්
එවන් ගහකොළ නසා තම සැප ගැන සිතන්නේ නොම්නිසු න්

බලය ශක්තිය ලබා ගැනුමට තිබෙන කෑදර කම නිමක් නෑ
ඛනිජ තෙල් ගල් අඟුරු හා දර පිළිස්සීමෙද නිමක් නෑ
එයින් පිටවන අඟරකම්මල වායුවේ විස නිමක් නෑ
එවන් වායුව නිසා ලොව උණුසුමේ වැඩුමද නිමක් නෑ

බලය ශක්තිය ලබා ගැනුමට ඛනිජ සම්පත් දවා ලන් නේ
එයින් තුටු පහ නොවන මිනිසුන් පරමඅනුවන් පුපුරවන් නේ
දිනෙන් දින මිහි කතකගෙ උණුසුම දරා ගැනුමට බැරිව යන් නේ
එයින් ලොව සතු සොබා සම්පත් ටිකෙන් ටික වැන සිලා යන් නේ

වායුවේ උණුසුම නිවා සිසිලස ගෙනෙන්නේ ගහ කොළ යි
නොදැනුවත් දන නිසා දින දින වැනසී යන්නෙත් ගහ කොළ යි
කැලය පතනද පිදුරු ගොඩ හා කසල ගොඩටත් ගිනි තබ යි
නාය යෑම ද ගං වතුර හා නියං බිය එහි ප්‍රතිඵල යි

මහා සාගර ජලය උණුව් ප්‍රසාරණව් ගොඩ ගලන් නේ
උතුරු ද්‍රුව සහ දකුණු ද්‍රුව හිම හා අයිස් කඳු දියව් යන් නේ
ගොඩට ගලනා සයුරු ජලයේ පමණ වැඩිව් විපත් වන් නේ
පහත් බිම් හා කුඩා දූපත් ලෝක පිඹුරෙන් මැකී යන් නේ

කෘත්‍රිම ක්‍රමයට කෙරෙන ගොවිතැනෙ පලේ රස ගුණ පිරිහෙ තේ
ජලය පස හා වායු සම්පත් එයින් වැනසී යනු ඇ තේ
කෘත්‍රිම ලෙස දිවි ගෙවන දන මන තොසින් දුරුවී රුදු වෙ තේ
එවන් කලකට ලොවේ ගුණ දම් සදාචාරය වැනසෙ තේ

පිනට දහමට තැනක් නැත ලොව මිල මුදල් මය උතුම් වන් නේ
සොබා සම්පත් විකුණ විකුණා මුදල් ගැරුමට මයි යෙදෙන් නේ
අම්ම අප්පත් දුවා දරුවත් මුදල් ගැරුමට උගස් වෙන් නේ
පංච දුශ්චරිතයයි ලොව සරු දහම් ලෙස ඉදිරියට එන් නේ

තමා සහ සැම සත සුරකිනා පරිසරේ ගුණ අගය කර නා
සියළු සතහට දයා කරුණා පා ඔවුන් අයිතිය සුරකි නා
තමා සම්පත් අනුන් යහපත තකා දීමට ලොබ නොකර නා
දනා ගැලවෙත් සසර සයුරින් ලබා නොමදව දහම් සර ණා

සහකාර කෘෂිකම් අධ්‍යක්ෂ
**රාජකරුණා දොළුවීර** විසිනි.